**ශීර්ෂ 263- හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---

(අ) හම්බන්තොට

(ආ) අම්බලන්තොට

(ඇ) තිස්සමහාරාම

(ඈ) ලුණුගම්වෙහෙර

(ඉ) සූරියවැව

(ඊ) අගුණකොළපැලැස්ස

(උ) තංගල්ල

(ඌ) බෙලිඅත්ත

(එ) ඕකෙවෙල

(ඒ) වීරකැටිය

(ඔ) වලස්මුල්ල

(ඕ) කටුවන

**1.1 විගණන විෂය පථය**

---

ඉහත 1 ඡේදයේ සඳහන් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,

අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

------

**2.1 විසර්ජන ගිණුම**

----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,005 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු. මිලියන 1,003 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 02 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.2 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 609 | 608 | 1 | 0.16 |
| මූලධන | 396 | 395 | 1 | 0.25 |
| **එකතුව** | **1,005** | **1003** | **2** | **0.2** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 33 ක් හා දෙපාර්තමේන්තු 20 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 2,772.15 ක් හා රු.මිලියන 2,256.86 ක් වශයෙන් එකතුව රු.මිලියන 5,029.01 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.මිලියන 2,748.17 ක් හා රු.මිලියන 2,193.38 ක් වශයෙන් රු.මිලියන 4,941.55 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ 11 ක් විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 23.98 ක්ද, දෙපාර්තමේන්තු 08 කින් රු.මිලියන 64.32 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. දෙපාර්තමේන්තු 05 ක් විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදනය රු.මිලියන 0.84 කින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 26301 | 35 | 35 | 25 | 27 | 155 | 140 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 983 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6003/0000/00/0039/0000/000 | 683 |
| 6000/0000/00/0011/0598/000 | 300 |
| | 983 |

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3 ශීර්ෂ 263 - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 03 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 05 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.112,745,040 ක් විය.

### 3.3 සීමා නොපිළිපැදීම

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් කටයුතු වෙනුවෙන් 2014 වර්ෂයට අදාලව පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු වියදමෙහි උපරිම සීමාව රු.35,000,000 ක් වූ නමුත් වර්ෂය අවසානයේ තථ්‍ය අගය රු.35,007,619 ක් වීමෙන් රු. 7,619 කින් වියදමෙහි උපරිම සීමාව ඉක්මවා තිබුණි.

### 3.4 විසර්ජන ගිණුම

**වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල විසින් ලබා දුන් ප්‍රතිපාදන**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තු 05 ක් විසින් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු.42,281,686 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන සීමාව රු.839,146 කින් ඉක්මවා එකතුව රු.43,120,832 ක උපයෝජනයක් කර තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ලබා දි තිබුණු ප්‍රතිපාදන උපයෝගී කරගෙන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාණිජ කුකුළු පාලන ගොවිපලවල් ඇති කිරීම සඳහා තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රදේශයේ පදිංචි ප්‍රතිලාභීන් 100 ක් බැගින් තෝරාගෙන තිබුණි. එසේ තෝරාගත් ප්‍රතිලාභියෙකුට කිකිළි පැටවුන් 200 ක් වනසේ කිකිළි පැටවුන් 100,000 ක් ඇති කිරීම සඳහා 2014 දෙසැම්බර් 31 දින වන විට රු.71,675,750 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. නමුත් කිකිළි පැටවුන් 46,000 ක් වෙනුවෙන් එකතුව රු.34,500,000 ක් වටිනා චෙක්පත් 10 ක් හා වර්ධක ආහාර කිලෝ ග්‍රෑම් 25 පැකට් 6,900 ක් වෙනුවෙන් එකතුව රු.13,627,500 ක් වටිනා චෙක්පත් 05 ක්ද, ලියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණත්, 2015 ජනවාරි 28 දින වන විටත් එම චෙක්පත් අත රඳවා ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු එකතුව රු.48,127,500 ක් වටිනා කිකිළි පැටවුන් හා වර්ධන ආහාර අදාල සැපයුම්කරුවන් විසින් ව්‍යාපෘතිය වෙත සපයා නොතිබුණි.

එමෙන්ම 2014 දෙසැම්බර් 31 දින වන විට බෙදාහැර තිබූ කිකිළි පැටවුන් 12,377 ක් සඳහා දින 45 ක් වෙනුවෙන් ලබා දිය යුතු නියමිත වර්ධක ආහාර ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 40,312 ක් වුවත්, එම ප්‍රමාණය ඉක්මවා එනම් අමතර කිලෝ ග්‍රෑම් 6,188 ක් ලබාදීම වෙනුවෙන් රු.488,852 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ගඩොල් කර්මාන්තකරුවන් නගා සිටුවීම සඳහා පළාත් නැගුම ජාතික වැඩසටහන යටතේ රු.2,598,750 ක් හා ජීවනෝප සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.895,185 ක් වශයෙන් රු.3,493,935 ක් වැය කර ගේජ් 34 ටකරන් තහඩු 6560 ක් මිලදී ගැනීම සඳහා අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය ලබා දි තිබුණි. නමුත් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවට රු.මිලියනයක උපරිමයට යටත්ව මිලදී ගැනීම් අනුමත කළ හැකි වුවත්, එම සීමාව ඉක්මවා මෙම මිලදී ගැනිම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ඈ) අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ළමා උද්‍යාන දෙකකට රු.124,000 ක් වැය කර රවුන් ඔන්චිල්ලා දෙකක් මිලදී ගෙන තිබුණත්, ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. එම ළමා උද්‍යාන දෙක සඳහා ලිස්සන පාලං 5 ක් හා මෙරිගෝරන්ඩ් 4 ක්

මිලදී ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා අදාළ සැපයුම්කරුට රු.102,200 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක් විසින් 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ලබා දි තිබුණු ප්‍රතිපාදන උපයෝගී කර ගෙන එකතුව රු.5,063,466 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත්, එම ද්‍රව්‍ය හා උපකරණ ප්‍රතිලාභින් වෙත බෙදා නොහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගබඩා කර තිබුණි.

(ඊ) බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.94,400 කට මිලදී ගත් කායවර්ධන උපකරණ කට්ටලයක් බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ ලියාපදිංචි වී නොතිබූ ක්‍රීඩා සමාජයක් වෙත ලබා දි තිබුණි. එම කායවර්ධන උපකරණ කට්ටලය බාහිර පුද්ගලයකු භාරයේ පවතින බව 2014 සැප්තැම්බර් 15 දින සිදු කළ විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) 2014 වර්ෂයේදී හම්බන්තොට ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාමීය පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ බඳගිරිය විද්‍යාලයේ "කරුණා" ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය රු.2,423,774 ක ගිවිසුම්ගත මුදලකට පුද්ගලික ඉදිකිරීම් සමාගමකට පවරා තිබුණි. විගණිත දිනය වූ 2015 පෙබරවාරි 20 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.2,181,397 ක් ගෙවා තිබුණි. ඇස්තමේන්තුවේ අයිතම් අංක 2.20 යටතේ අඟල් 3ක් ඝණකමට පොළව හා ප්‍රිස්ම කොන්ක්‍රීට් යොදා ගෙබිම, ප්‍රිස්ම හා කයිරුව අඟල් ½ ඝණකමට කපරාරු කර සිමෙන්ති මැදීමේ කාර්යය නියමිත පරිදි ඉටුකර නොතිබුණි. මේ නිසා ගොඩනැගිල්ලේ ගෙබිම හා පේමන්ට් පුපුරායාමෙන් කපරාරුව ගැලවී ගෙබිමේ හා පේමන්ට්හි වලවල් සෑදී තිබුණු අතර ඒ සඳහා රු.685,883 ක් ඉහත ගෙවීම්වල ඇතුළත්ව තිබුණි.

(ඌ). දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ අංශය විසින් 2012 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඇති වූ අධික වර්ෂාපතනය හේතුවෙන් විනාශයට පත් බඳගිරිය පන්සල්වත්ත වෙල්යාය සඳහා ජලය ගෙන යන පීල්ල නැවත සකස් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ඇස්තමේන්තුවක් සැකසීමෙන් සහ ව්‍යාපෘති ගිවිසුමක් ඇතිකර ගැනීමෙන් තොරව හදිසි ප්‍රසම්පාදනයක් ලෙස සළකා පුද්ගලික ආයතනයක් වෙත

කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් 2013 නොවැම්බර් මාසයේදී ව්‍යාපෘති සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත 2014 මැයි 23 දින කොන්ත්‍රාත්කරුට රු.525,000 ක් ගෙවා තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ වැඩ වටිනාකම ඉක්මවා රු.269,280 ක් වැඩිපුර ගෙවා තිබුණු බව විගණන භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(එ) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජාතික සුරක්ෂිත දිනය 2014 ට සමගාමීව ආපදාවලට ඔරොත්තු දෙන නිවාස සෑදීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් රු.500,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. යහංගල බටහිර පදිංචි ප්‍රතිලාභියෙකු වෙත නිවසක් ඉදිකිරීමට එම ප්‍රතිපාදනවලින් පළමු වාරිකය ලෙස රු.250,000 ක් 2014 ඔක්තෝබර් 10 දින ගෙවා තිබුණි. එම නිවසේ කරන ලද වැඩ වටිනාකම පිළිබඳ කාර්මික නිලධාරියෙකුගේ නිර්දේශයකින් තොරව නිවාස කමිටුවේ නිර්දේශය මත පමණක් පදනම්ව 2014 දෙසැම්බර් 31 දින දෙවන වාරිකය ලෙස රු.250,000 ක් ගෙවා තිබුණි. නමුත් විගණන දිනය වූ 2015 පෙබරවාරි 20 දින වන විටත් ප්‍රතිලාභියා විසින් නිවස සම්පූර්ණයෙන් ඉදිකිරීම අවසන් කර නොතිබුණු අතර එදිනට නිවසේ කළ වැඩවල වටිනාකම රු.256,641 ක් බව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීගේ වාර්තාව අනුව නිරීක්ෂණය විය.

(ඒ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ආපදා නිසා හානියට පත් වූ නිවාස සඳහා සහනාධාර ලබාදීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 03 දෙනෙකු වෙත වාරික දෙකම වෙනුවෙන් ලියා තිබුණු එකතුව රු.300,000 ක් වටිනා චෙක්පත් 06 ක් 2015 පෙබරවාරි මාසයේදී රාජ්‍ය ආදායමට බැරකර තිබුණි.

(ඔ) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දහම් පාසල් ආගමික කටයුතු සඳහා 2012 ජූලි 10 දින රු. 100,000 ක් බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. විගණිත දිනය වූ 2015 පෙබරවාරි 20 දින වන විටත් අදාල වැඩසටහන ක්‍රියාත්මක නොකර එම ප්‍රතිපාදන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 3.5 පොදු තැන්පත් ගිණුම

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.967,969 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.57,340,512 ක් අදාල කාර්යය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) 2014 ඔක්තෝබර් 31 දිනැති අංක PF/FD/04/148 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂගේ ලිපිය ප්‍රකාරව ධාන්‍ය නිෂ්පාදනය සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීමට රු.මිලියන 300 ක් වියදමක් ලෙස ගිණුම්ගත කර අංක 6000/0000/000/0011/0598/000 දරන පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණි. එම ලිපියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකර විගණිත දිනය වූ 2015 අප්‍රේල් 20 දින වන විටත් එය අක්‍රීය තැන්පතුවක් වශයෙන් පැවතුණි.

### 3.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 26301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,179,947 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 19 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණි.

### 3.7 වත්කම් කළමනාකරණය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය වර්ෂ |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 01 | 03 |
| (ii) | මෝටර් වාහන (ත්‍රීවීලරය) | 01 | 08 |
| (iii) | යන්ත්‍ර සූත්‍ර | 01 | 13 |

**(ආ) පාඩු හා හානි**

**--------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක 1987 වර්ෂයේ සිට 2005 වර්ෂය දක්වා සිදුව තිබූ රු. 13,752,451 ක්වූ හානි 12 ක් පොත්වලින් කපා හැරීමට කටයුතු කරන බව වසර කිහිපයක සිට විසර්ජන ගිණුමේ දක්වා තිබුණද 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම හානි පොත්වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉකුත් වර්ෂයේ විසර්ජන ගිණුමෙහි දක්වා තිබූ හානි සම්බන්ධයෙන් කටයුතු කිරිමට මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩලය පත්කර තිබුණි. නමුත් රු. 1,631,903 ක් වූ හානි 04 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තා 2014 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**-----------------**

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| | **රු.** | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 137,138,139 හා 237 | 3,092,987 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට අසම්පූර්ණ ගනුදෙනු සඳහා චෙක්පත් 31 ක් ලියා විගණිත දිනය වූ 2015 ජනවාරි 28 වන විටත් එම චෙක්පත් අත රඳවාගෙන තිබුණි. |
| | 3,275,274 | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට අසම්පූර්ණ ගනුදෙනු සඳහා සහ ගබඩාවට ලැබී නොතිබූ භාණ්ඩ වෙනුවෙන් චෙක්පත් 31 ක් |

| | | | |
|---|---|---|---|
| | | | ලියා විගණිත දිනය වූ 2015 පෙබරවාරි 20 දින වන විටත් ආදායකයාට භාරනොදී අත රදවාගෙන තිබුණි. |
| | | 595,825 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විට අසම්පූර්ණ ගනුදෙනු සඳහා සහ ගබඩාවට ලැබී නොතිබූ භාණ්ඩ වෙනුවෙන් චෙක්පත් 04 ක් ලියා විගණිත දිනය වූ 2015 මාර්තු 09 දින වන විටත් ආදායකයාට භාරනොදී අත රදවාගෙන තිබුණි. |
| | | 3,909,650 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් රියදුරු පුහුණුව ලබාදීම වෙනුවෙන් රියදුරු පාසල් වෙත 2014 දෙසැම්බර් 31 දින වන විට ලියා තිබුණු චෙක්පත් 11 ක් විගණන දිනය වූ 2015 මැයි 31 දින වන විටත් අත රදවා ගෙන තිබූ අතර එදින වන විටත් අදාල රියදුරු පාසල් විසින් ප්‍රතිලාභීන් වෙත රියදුරු පුහුණුව ලබාදී අවසන් කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි 215 (3)( අ) | 651,240 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් 2014 දෙසැම්බර් 31 දිනට ලියා තිබූ චෙක්පත් 159 ක් අවලංගු කර 2015 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. |

## 3.9 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

-----------------------------------------------------

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

-----------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| ------------- | ------------------ | ----------------- | --------------------- |
| | රු. | | |
| අලුත් පාලම පරණ පාලම දක්වා කෝපිවත්ත මාර්ගය කපා සකස් කර කොන්ක්‍රීට් කිරීම. | 995,655 | 2014.08.28 | ගිවිසුම්ගත සමිතිය විසින් වර්ෂය අවසාන වන තෙක් වැඩ ආරම්භ නොකිරීම. |
| වකමුල්ල කුඹුරුයායේ තුප්පහිගේ ලියද්ද අසල අමුණ ඉදිකිරීම. | 289,729 | 2014.07.30 | මෙය ව්‍යාපාරික ව්‍යාපෘතියකි. අස්වනු නෙලීමෙන් පසුව ඊලඟ කන්නය සඳහා කඩිනමින් ජලය ලබා දීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. |
| රණසිංහපුර එම්.ආර්.එම්.තාසිම් විදුහලට 60 X 20 ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 194,000 | - | අදාල මන්ත්‍රීතුමා විසින් යෝජනාව සංශෝධනය නොකිරීම. |
| රණවරාව ඉදිකොලේ පාර දෙවන පටුමග පානීය ජලය ලබා දීම. | 150,000 | | ඇස්තමේන්තු ගෙන්වා ගැනිමට නොහැකි වීම. |

## 3.10 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටීයෙන් බැහැර වීම.**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 වර්ෂය වෙනුවෙන් ඕකෙවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,500,000 ක් වටිනා ප්‍රසම්පාදන තිරණ 02 ක් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ තෙවන සමාජිකයා අත්සන් කර නොතිබුණි.

(ii) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 නොවැම්බර් 10 දින වන විට ආරමභ කර තිබුණු රු.6,598,824 ක් වටිනා ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1, 8.9.2 හා 8.9.3, මාර්ගෝපදේශ ප්‍රකාරව විධිමත් පරිදි ගිවිසුම්වලට එළැඹ නොතිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය හා ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවට වෙළඳපල මිළ සැඳහුම් ක්‍රමය යටතේ රු.මිලියන 2 ක ප්‍රසම්පාදන අනුමත කළ හැකි වුවත්, වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ය විසින් එම සීමාවන ඉක්මවා රු.4,250,241 ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ii) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා 2014 දෙසැම්බර් 27 සහ 28 යන දෙදින ඉඩම් කටයුතු හා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහනක් පවත්වා තිබුණි. ඒ සඳහා සහභාගී වූ නිලධාරීන් 230 ක් වෙනුවෙන් ආහාර සැපයීමට රු.151,800 ක් වටිනා චෙක්පතක් පෞද්ගලික හෝටලයක් නමින් ලියා 2014 දෙසැම්බර් 31 දින වන විටත් අත රදවා ගෙන තිබූ අතර විගණන දිනය වූ 2015 පෙබරවාරි 09 දින වන විටත් අදාල වැඩසටහන පවත්වා නොතිබුණි.

**3.11 අනාර්ථික ගනුදෙනු**

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 වර්ෂයේදී ඇති වූ වර්ෂාව හේතුවෙන් තම්මැන්නාව වැවේ වැව් කණ්ඩිය සහ පැරකුම් ගොවි සංවිධානය යටතේ තිබෙන අලුත්වැව

කණ්ඩිය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය 2013 නොවැම්බර් 04 දින සිට 10 දින දක්වා සිදු කර තිබුණි. ඒ වෙනුවෙන් පිරිවැය ඇස්තමේන්තුවක් හා කොන්ත්‍රාත් ගිවිසුමකට එළැඹීමෙන් තොරව ගොවි සංවිධානයක් වෙත පවරා තිබූ අතර තාක්ෂණික වාර්තාවක් ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුට රු.525,000 ක් 2013 නොවැම්බර් 12 දින ගෙවා තිබුණි. 2013 ඔක්තෝබර් 03 දින දිස්ත්‍රික් ලේකම් විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ ලිපිය ප්‍රකාරව ඉහත වැව් කණ්ඩි දෙකම ප්‍රතිසංස්කරණය කිරීමට එක්ස්කැවේටර් මීටර් පැය 150 ක් වෙනුවෙන් පැයකට රු. 3,500 බැගින් රු. 525,000 ක් ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එම ලිපියට පටහැනිව වයිබ්‍රේටර් යන්ත්‍රය පැය 05 ක් සහ ට්‍රැක්ටර් පැය 45 ක් යොදා ගැනීම වෙනුවෙන් රු.232,500 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2014 ඔක්තෝබර් 10 දින සිදු කළ විගණන භෞතික පරීක්ෂාවේදි ඇල කණ්ඩි දෙකම නියමිත ප්‍රමිතියෙන් යුතුව සකස් කර නොතිබූ අතර ඇල කණ්ඩියේ පස් ස්ථාන දෙකකින් සම්පූර්ණයෙන් ගැලවී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.12 කළමනාකරණ දූර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) හම්බන්තොට ගොන්නෝරුව කනිෂ්ඨ විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහිත අක්කර 05 ක ඉඩමෙන් අංක 2010/63 මිනුම් නියෝගය අනුව අක්කර 03ක් පමණක් මැන බෙදා වෙන්කර දි තිබුණි. ඉතිරි අක්කර 02 මැන බෙදා වෙන්කර විද්‍යාලයට පවරා දීමට හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණු අතර එසේ බෙදා වෙන්කර නොතිබූ අක්කර 02 ක ඉඩම් කොටස පුද්ගලයෙකු විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඕමාර කනිෂ්ඨ විද්‍යාලය සඳහා අත්පත් කර ගැනීමට නියමිත ඉඩමේ කොටසක ඕමාර නැගෙනහිර පදිංචි පුද්ගලයකු විසින් නිවසක් ඉදි කරමින් පවතින බව ග්‍රාමනිලධාරී විසින් 2012 අගෝස්තු 09 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දන්වා තිබුණි. ඒ අනුව ඉදිකිරීම් නතර කර ඉන් ඉවත් වන ලෙස 2012 අගෝස්තු 14 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා තිබුණත් විගණිත දිනය වූ 2014 නොවැම්බර් 10 දින වන විට එම පුද්ගලයා ඉඩමේ ස්ථිර නිවාසයක් සාදා පදිංචිව සිටින බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක් විසින් 2014 දෙසැම්බර් 31 දිනට ලියා තිබූ රු.1,960,388 ක් වටිනා චෙක්පත් 205 ක් අවලංගු කර 2015 වර්ෂයේදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 38 | 08 | - |
| (ii) | තෘතියික මට්ටම | 31 | 15 | 16 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,018 | 966 | 116 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 122 | 114 | 14 | 06 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 01 | 62 | - | 61 |
| | **එකතුව** | **1,218** | **1,195** | **154** | **131** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ,

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 154 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ii) බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව 131 ක් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.